# පුරාතන ලංකාවේ ආර්ථික අංශය පිළිබඳ ලේකම්මිටි හා අභිලේඛන ඇසුරෙන් සංසන්දනාත්මක අධ්‍යයනයක්

ඒ.අයි.සත්සරා

මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

sathsaraaluthge@gmail.com

ප්‍රමුඛ පදඃලේකම්මිටි, ආර්ථික අංශය, ඉඩම් භුක්තිය, බදු

## හැඳින්වීම

පුරාතන ලංකාවේ ආර්ථික අංශය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී සාහිත්‍යමය මූලාශ්‍රය ද ඒ ඔස්සේ සමගාමීව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ද උපයුක්ත වේ. නමුත් බොහෝ දෙනා තුළ නිසි අවබෝධයක් නොමැති ලේකම්මිටි නමැති මූලාශ්‍රය ආර්ථික පැතිකඩ අධ්‍යයනය කිරීමට ඇති වැදගත් මූලාශ්‍රය වේ. එමෙන්ම එය පුරාවිද්‍යාවේ දී අදාළ නොකරන සාධකයකි. වත්මනෙහි ආර්ථික අර්බුදයකට පත්ව සිටින අප රටෙහි අතීතයේ ආර්ථික සැකැස්මෙහි විනිවිදභාවය හඳුනාගැනීමටත් එතුළින් ප්‍රායෝගිකත්වයටත් එළඹිය හැකි වැදගත් තොරතුරු රැසක් මෙම ලේකම්මිටි සහ අභිලේඛන තුළ අන්තර්ගතව පවතී.

## අරමුණ

මෙම පර්යේෂණයේ දී ලේකම්මිටි හා අභිලේඛන ඇසුරෙන් ලංකාවේ ආර්ථික අංශය පිළිබඳ සංසන්දනාත්මක විමර්ශනයක් කරනු ලබන අතර එය පුරාවිද්‍යාවට කොතෙකුත් දුරට ඉවහල් කරගත හැකිද යන්නත් විමසා බැලීම සිදු කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේදී මූලික වශයෙන් අභිලේඛන සහ ලේකම්මිටි යන ප්‍රාථමික මූලාශ්‍රයගත කරුණු සංසන්දනාත්මකව විමර්ශනයට ලක් කළ අතර ඊට අමතරව ද්විතියික මූලාශ්‍රය ද අධ්‍යයනයට ලක් කරන ලදි. මෙම මූලාශ්‍රය ඇසුරින් ප්‍රස්තුතයට අදාළව එක් රැස් කරගන්නා ලද දත්ත සංසන්දනාත්මකව විමර්ශනය කිරීම පර්යේෂණ ක්‍රමවේදය වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡා

ලේකම්මිටි යනුවෙන් පොදුවේ ව්‍යවහාර වන්නේ ලේඛකයින් විසින් වාර්තාගත කරන ලද ලියවිලි ගොන්නකටය. මහනුවර යුගයේ දී මධ්‍යම හා ප්‍රාදේශීය පාලනය සඳහා උපයෝගී කරගන්නා ලද රාජ්‍ය ලේඛන පොදුවේ ලේකම්මිටි නමින් හැඳින්වේ (අභයවර්ධන, 2009, 1). ඉපැරණි ශ්‍රී ලංකාවේ ආර්ථික රටාව සහ බදු අයකිරීම් පටිපාටිය පිළිබඳ ව අධ්‍යයනය කළහැකි තවත් වැදගත් මූලාශ්‍රයක් ලෙස අභිලේඛන හඳුනාගත හැකිය.

ලේකම්මිටි සහ අභිලේඛන යන මූලාශ්‍රයයන් ද්විත්වයම සංසන්දනය කිරීමේ දී සමකාලීනව පැවති ගම සහ ගම් වර්ග පිළිබඳ ව පැහැදිලි චිත්‍රයක් නිරූපණය කර ගත හැකිය. විජය රජුගෙන් (ක්‍රි.පූ. 483-445) ආරම්භ වූ ලංකාවේ ආර්ය ජනාවාස ගම් කේන්ද්‍ර කොට පිහිටවනු ලැබී ය. (ම.ව. 7:

3).ලේකම්මිටි අධ්‍යයනය කිරීමේදී ගමේ ගොඩමඩ ඉඩම් පිළිබඳව තොරතුරු බහුලව හමු වේ. එම නිසා මධ්‍යයතන යුගයේ දී ප්‍රධාන ආදායම් ඒකකයක් වශයෙන් උඩරට රාජ්‍ය පාලකයන්ගේ අවධානය යොමු වී තිබුණේ ගම කෙරෙහිය (අභයවර්ධන, 2009, 231).

**උදා: සතර කෝරලේ ලේකම්මිටිය**

**"........... අත්තනගොඩ වනිසුන්දර නෛදේ හිගුලේ සමරසිංහ නෛදේ එම ගම ගේවතුපොලගෙ නෛදේ මුරුතවල ඉනියාරච්චි නෛදේ එම ගම මනම්පේරි නෛදේ එම ගම අටුගොඩ නෛදේ එම ගම රදා හේවාය..........."**

ගම් පිළිබඳව සඳහන් වන අභිලේඛන විමර්ශනය කිරීමේ දී අයත් IVවැනි උදය රජුගේ (ක්‍රි.ව.942-952) බදුලු ටැම් ලිපිය සහ IV වැනි මිහිඳු රජුගේ (ක්‍රි.ව. 953-969) වේවැල්කැටිය ශිලා ලේඛනය සඳහන් කළ හැකිය. බදුලු ටැම් ලිපියේ පරමාර්ථය හෝපිටිගම නමැති ගමේ පාලනය ගැන නීති රීති පැනවීමය. මෙම ලිපියෙන් වාණිජ හා පරිපාලන රීති රාශියක් ඉදිරිපත් කර ඇත.

**උදා: බදුලු ටැම් ලිපිය**

**"........... සිරිසගබො උදා මහරදහු කුමා සත්ලැගු දෙවන හවුරුදුයෙහි නිකිත්නි සන්ද් අව විසෙනියි සොර බරහි ආවු හොපිටි ගමුජදියැ වැපාරයන් ..........."**

ගම් දහයක් පාලන ඒකකයක් වශයෙන් සලකා දසගම් පාලනය (ගම් දහයකින් යුත් සමූහයක්) ගැන විස්තර වන වේවැල්කැටිය ශිලා ලේඛනය ද මෙවැනිම වැදගත්කමක් ඇති පළාත් පාලන ප්‍රඥප්තියක් වශයෙන් සැලකිය හැකිය.

**උදා: වේවැල්කැටිය ශිලා ලේඛනය**

**"........... සිරිසඟ්බො අභය් මහරජ්හු පුත් සිරිසඟ්බො අභය් මහරජ්හු සත් ලැගු නව වන හවුරුදුයෙහි උන්දවප් සන්ද් පෙරෙ අඩ මස්හි දස පක් දවස් උතුරු පසැ අම්ගම්කුළියෙහි කිබි නිල මිහි දෙමෙල්වෙහෙර් පමණියෙන් දසගමට එකෙක ..........."**

මීට අමතරවගම් පිළිබඳව මූලාශ්‍රය සංසන්දනය කිරීමේදී ශක වර්ෂ 1712 ලියවුණු උඩපළාත ලේකම්මිටියේ එය "**ගම**" යන අර්ථය පමණක් ඇතිව දක්නට ඇත. එමෙන්ම නිශ්ශංකමල්ල රජුගේ කන්තලේ සෙල්ලිපියේ "**සත්‍රයට ගම්වරක් ආදිවූ අයද**" යනුවෙන් දැක්වේ. රඹෑව සෙල්ලිපියේ ද"**වගුරු පිටි සම්භොග ගමු**" ලෙස ගම පිළිබඳව දැක්වේ.

ආර්ථික අංශය පිළිබඳව විමර්ශනය කිරීමේදී ඉඩම් භුක්ති ක්‍රමය එහි වැදගත් පැතිකඩකි. ඒ අනුව ලේකම්මිටි සහ අභිලේඛන එකිනෙකට සංසන්දනය කිරීමේදී ඒ පිළිබඳ සුවිශේෂී තොරතුරු රැසක් අනාවරණය කරගත හැකිය. එමෙන්ම මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ මෙම මූලාශ්‍රය ද්විත්වයම අදාළ කාලපරිච්ඡේදයට සමකාලීනව රචනා වී තිබීම නිසා එකී තොරතුරු බොහෝ දුරට නිරවද්‍යතාවයෙන් පසු වීමයි. ඒ අනුව කුඹුරු සහ හේන් පිළිබඳව ලේකම්මිටි තුළින් දැක්වෙන තොරතුරු පිරික්සීමේදී මහනුවර යුගයේ රජවරුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස කුඹුරුවලින් ලැබෙන බදු සඳහන් කළ හැකිය. ලේකම්මිටිවල නින්ද කුඹුරු, අස්වැද්දූම කුඹුරු, මුත්තෙට්ටු කුඹුරු, සාරමාරු කුඹුරු, කරමාරු කුඹුරු, විහාරවසම්වලට අයත් කුඹුරු, දේවාලවසම්වලට අයත් කුඹුරු, විවිධ හේවාවසම්වලට අයත් කුඹුරු ඇතුළත් කර ඇත (අභයවර්ධන, 2009, 245).

**උදා: දුම්බර හී ලේකම් මිටිය(25 පිටුව)**

**1. "පිටියේගෙදර මැනික් රාලයාට ගෙදර කුඹුර පල්ලිය වෙල දහස ලහයි" (87 පිටුව)**

**1. "අතපත්තු සුවදුට වෙල කුඹුර අතපත්තු අප්පුට වෙල කුඹුර"**

කුඹුරු පිළිබඳ සඳහන් අභිලේඛන පිරික්සීමේදී පහත දැක්වෙන අභිලේඛන වැදගත් වේ.

**උදා: මුතුගල්ල - "තිණි (කරිහ) කුබර"**

**දුනුමඩලාකන්ද - "මජෙක වපික කෙත"**

**සිතුල්පව්ව - "දකගම කෙත"**

එමෙන්ම අභිලේඛන තුළින් කුඹුරු සහ ගම් යනාදියෙහි කොටස් හිමිකරුවන්ට එම කොටස්වලින් ආදායම් හිමි වීම, වැව්, කුඹුරු සහ ගම්වල ආදායම් කොටස් විහාරයනට පූජා කිරීම ආදිය පිළිබඳවද සුවිශාල තොරතුරු ප්‍රමාණයක් ප්‍රේරණය කොට ගත හැකිය.

ආර්ථිකයේ මුඛ්‍යතම ලක්ෂණය වූ බදු අයකිරීම් පටිපාටිය අධ්‍යයනය කිරීමට ඇති මුඛ්‍යතම මූලාශ්‍රය අභිලේඛන වේ. ඒ හා සමගාමීව යන්නා වූ තවත් මූලාශ්‍රය නම් ලේකම්මිටි වේ. අයබදු සහ බදුවල එකතුව ඇතැම් විට අයබදු පඬුරු යනුවෙන් හැඳින්වේ. පඬුරු යනුවෙන් හැඳින්වෙන්නේ මුදලින් කරන ගෙවීමයි. ප්‍රධාන බදු දෙකක් ආදී සෙල්ලිපිවල දක්නට ලැබේ. මේවා දකපති හෙවත් දක-පෙක සහ බොජ, බොජිය, බොජික, බොජිකපති හෙවත් බෙජි, බෙජ-පෙක විය (කොඩ්රිංටන්, 2016, 45). මීට අමතරව තෙවැනි බද්දක් පිළිබඳවද සෙල්ලිපිවල සඳහන් කොට ඇත. එය **උතු කුබර කර බද්ද** වේ. තෝනිගල සෙල්ලිපියේ මෙම බදු පිළිබඳව සඳහන්ය. බෝගයෙන් රජුට අයත් කොටස මහාවංසයෙහි **කර, රජකර හෙවත් බලි** යන නම්වලින් හඳුන්වනු ලැබේ. එය වැල්මිල්ල සෙල්ලිපියේ දක්වා ඇත්තේ **දෙකරලින්** හෙවත් (දෙකන්නයෙන්)ලැබෙන බද්දක් වශයෙනි. දුම්බර හී ලේකම්මිටියේත්, කත්හාල් ලේකම්මිටියේත් දුම්බර පිහිටි කරල්ලියද්ද යන ගමේ නම කරවුලියද්ද වශයෙන් සඳහන් වේ. ලේකම්මිටිවල සඳහන් පරිදි බදු වැඩි වශයෙන්ම ලබාගන්නා ලද්දේ ධාන්‍යවලිනි. ශ්‍රම ශක්තිය මගින් රාජකාරිය ඉටු කිරීමෙන් කරන ලද්දේ එක්තරා ආකාරයකට බදු ගෙවීමකි. මේ හැරුණු විට ගිරා, කැති, හිරමනා, කිල්ලෝට ආදී ද්‍රව්‍යවලින්ද බදු ගෙවන ලද අවස්ථා ලේකම්මිටිවල දැක්වේ.

මුදල් පිළිබඳව සඳහන් කිරීමේදී ලේකම්මිටි රචිත යුගයේදී රිදී, පනම්, තුට්ටු, මස්ස වැනි කාසි භාවිත විය. බොහෝ තැන්වල කහා, කෙහා, කහාය වශයෙන් සඳහන් වන්නේ කහවනු විය හැක. කහවනු පිළිබඳ සෙල්ලිපි සාධක ද බොහෝ ප්‍රමාණයක් සඳහන් වේ.

ආර්ථික සංවිධානය තුළ ආදායම් නිළධාරීන් පිළිබඳව සඳහන් කිරීමේදී අනුරාධපුර යුගයේ අනුගමනය කළ ක්‍රමවේදයන් සෙල්ලිපි තුළින් හැඳිනිය හැකිය. නිදසුන් ලෙස **"වෙලයුත් සම්දරුවන්","බඩකරිය"** ආදිය දැක්විය හැකි ය. මහනුවර යුගයේදී වඩා විධිමත් ලෙස බදු අය කරගැනීමට **"ලේකම්වරු"**, **"කංකානම්වරු"**, **"විදානේවරු"** ආදී නිළධාරී මඬුල්ලක් සිටි බවට ලේකම්මිටි සාක්ෂි සපයයි.

**නිගමනය**

මේ අනුව ලේකම්මිටි සහ අභිලේඛන වූ කලි මූලාශ්‍රය ද්විත්වයක් වුවත් එකී සංයෝගය තුළින් පුරාතන ලංකාවේ ආර්ථික අංශය එනම් ගම්, ඉඩම් භුක්ති ක්‍රමය, බදු අයකිරීම් පටිපාටිය, මුදල් සහ ආදායම් නිළධාරීන් පිළිබඳ ව නවමු ඇසකින් දෘෂ්ටිගත විය හැකි මෙන්ම පුරාවිද්‍යාවට අදාළ යම් යම් කරුණු එතුළින් උපයුක්ත කරගත හැකි බවද සමස්තයක් අනුව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අභයවර්ධන, එච්.ඒ.පී. (2009)***ලේකම්මිටි විමර්ශනය.*** කොළඹ: ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.

කොඩ්රිංටන්, එච්.ඩබ්ලිව්. (2016)***ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා ආදායම.*** කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ප්‍රියංක, බෙනිල්. (2015)***ක්‍රි.ව. 1,2,3 සියවස්හි ලක්දිව සෙල්ලිපි ඇසුරෙන් සකස් කරන ලද දත්ත.***කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Paranavithana, S. (1943) ***Epigraphia Zeylanica.vol.1***. Amen House: Oxford University Press.

Wickramasinghe, D.M. (1912)***de Z, Epigraphia Zeylanica.*** vol.1. Colombo: Archealogical Survey of Ceylon.